2024 ජූලි

# දයාබර සොයුරියනි,

මාගේ දයාබර ස්වාමිපුරුෂයා මෙන්ම අපගේ ආත්මික පියාණන් වන මෙට්‍රොපොලිටන් හිමිපාණන් ආශිර්වාද මතකයක් වී අපගෙන් වෙන්ව ස්වාමින් වහන්සේ වෙත ගොස් මාස දෙකක කාලයක් ගත වී ඇත. එය පවුලක් ලෙසත්, බිෂොප්වරුන් ලෙසත්, සභාවක් ලෙසත් කිසිවෙකු බලාපොරොත්තු නොවූ අනපේක්ෂිත සිදුවීමකි. එතුමාණන්ගේ වෙන්ව යාම පිළිබඳව ශෝක වෙමින්; එතුමාණන් ජීවත්ව සිටිය කාලය පිළිබඳව මෙනෙහි කරමින්, වසර ගණනාවක් පුරා සිදු කරනු ලැබූ විශ්වාසවන්ත සේවයත්, ක්‍රිස්තුන් වහන්සේව අන් අයට හඳුන්වා දීමට එතුමාණන් විසින් කරනු ලැබූ සියලු ක්‍රියාමාර්ග සහ අසරණ අයට උපකාර කරමින් සභාවට නායකත්වය ලබා දුන් ආකාරය සිහිපත් කරමින්; අපි සියලු දෙනාම එක්ව; කඳුළින් යුතුව එතුමාණන්ගේ භූමිදානය සිදුකළේය.

එම අවස්තාවට සහභාගිවීමට නොහැකි වූ සියලු දෙනා සජීවී විකාශය තුළින් අප සමග සම්බන්ධ වූ බව මා විශ්වාස කරමි. මොට්‍රොපොලිටන් හිමිපාණන්ට සමුදීම සඳහා ප්‍රභුවරුන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද අති විශාල ලෙස පැමිණි ආකාරය සැබවින්ම පුදුම සහගතය. එතුමාණන්ගේ ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය සහ සුභාරංචිය ඔවුන්ගේ ජීවිතය සමග ස්පර්ශ කර තිබුණි. මෙම මෙහෙය අතරතුරදී එම විශාල තිරය මත අපගේ පවුල ද දකින්නට ඇතැයි මම සිතමි. එය පහසු දෙයක් නොවීය, නමුත් මෙම සැබවින්ම දුක්බර මොහොතේදී එහි ප්‍රසිද්ධියේ පෙනී සිටීමට අවශ්‍ය කරුණාව දෙවියන් වහන්සේ විසින් අපට ලබා දුන්නේය. එම අවස්තාවේදී අපට අවශ්‍ය ශක්තිය ලබා දෙන පිණිස දෙවියන් වහන්සේට යාච්ඤා කළ ඔබ සියලුම දෙනාට බෙහෙවින් ස්තුති කරමි.

දින 40 ක කාලය අවසන් වන තෙක් මා මාගේ දියණිය වන සාරා සහ ඇයගේ පවුලේ අය සමග නැවතී සිටි අතර, මා නැවත නිවසට පැමිණීමට පෙර අපගේ නව මෙට්‍රොපොලිටන් හිමිපාණන්ව තෝරා පත් කරනු ලැබීය. මාගේ ස්වාමිපුරුෂයාගේ නික්ම යාමෙන් පසු මාගේ අවධානයට භාජනය විය යුතු බොහෝ දේ ඇති අතර, මාගේ පවුලේ සියලු දෙනාගෙන් මා හට ලැබෙන සියලු උපකාර සහ ප්‍රේමය පිළිබඳ මා බෙහෙවින් කෘතඥ වෙමි.

මා නිවසට පැමිණි මොහොතේ සිට, අපගේ සභාවේ සිටින අපට මහත් ලෙස ප්‍රේම කළ සහ අප උදෙසා යාච්ඤා කළ සියලුම සහෝදරියන් පිළිබඳව මම කල්පනා කළෙමි.

මාගේ ස්වාමිපුරුෂයාගේ වෙන්ව යාමෙන් පසුව මා යළිත් යථා තත්ත්වයට පත්වීම පිළිබඳව ඔබ පුදුම වනු ඇතැයි සිතමි.

දයාබර සොයුරියනි, මා මෙම ලිපිය ඔබට ලියන්නේ එම දුෂ්කරකාල වකවනුව තුළදී මා එම අභියෝගයට මුහුණ දුන් ආකාරය සහ දෙවියන් වහන්සේගේ කරුණාව මා හට ලබා දී ඇති ආකාරය පිළිබඳව ඔබ දැනුවත් කිරීම සඳහාය. අප ජීවත් වන්නේ වැටුණු ලෝකයක වන අතර, අප සියලුම දෙනාට අපගේ ජීවිත තුළදී අරගල වලට සහ යම් ආකාරයක අලාභහානි වලට මුහුණ දීමට දීමට සිදුවනු ඇත. අද දිනයේදී මා ඔබට ලියන දෙය අනාගතයේදී ඔබට යම් ආකාරයක උපකාරයක් වනු ඇත.

අපගේ මුණුපුර මිණිපිරියන් ද ඇතුළුව අපගේ පවුලේ සියලුම දෙනාට මෙට්‍රොපොලිටන්තුමාණන් බොහෝ සේ මග ඇරිණි. එතුමාණන් බොහෝ සේ සංචාරයන් කළ නමුත් එතුමණන් නිතරම නිවසට පැමිණියේය. දැන් අපට නැවතත් එතුමාණන් දැක ගැනීමට අප ද ස්වර්ගයට යන තෙක් බලා සිටිය යුතුය. මා පිළිබඳව කතා කරන විට, මෙට්‍රොපොලිටන්තුමා සහ මා විවාහ වී වසර 50 කට (වසර 50 ට දින 12 ක අඩුය) ආසන්න වන අතර, අපගේ ජීවිතයේ අවසාන කාලය ස්වාමින් වහන්සේට සේවය කරමින් එක්ව ගත කිරීමට අප බලාපොරොත්තු වූයෙමි. නමුත් ඒ සියල්ල වෙනස් කරමින් හදිසි අනතුර සහ මරණය එතුමාණන් මේ මිහිතලය මතින් සමුගැනීමට පෙර අවසන් සංවාදයේ නිරත වීමට හෝ අපට ඉඩ ලබා දුන්නේ නැත.

මට තේරුම් ගැනීමට නොහැකි බොහෝ දේ එහි තිබේ. පිළිතුරු ලබා ගැනීමට සදාකාලික ජීවිතය ලැබෙන තෙක් බලා සිටිය යුතු ප්‍රශ්න ද මා සතුව ඇත. ඒ වන තෙක්, අපගේ පරමාධිපති ස්වාමින් වහන්සේව විශ්වාස කිරීමට මා තීරණය කළෙමි. මන්දයත්, ඔවුන් වහන්සේගේ වචනයේ පවසන්නේ, ඔවුන් වහන්සේ යහපත් බවත්, ඔවුන් වහන්සේ ප්‍රේමය බවත්, ඔවුන් වහන්සේට එක වැරදීමක් හෝ සිදු නොවන බවත්ය.

මාගේ කඳුළු, මට දැනෙන තනිකම සහ මා අත්විඳින දුක සහ වේදනාව පිළිබඳව ජේසුස් වහන්සේ සැලකිළිමත් වන්නේද? දෙවියන් වහන්සේගේ වචනය තුළින් මට සහතික වන්නේ ඔවුන් වහන්සේ මේ ලෝකයේ වාසය කරමින් මා අත්විඳින සියලුම දේ ඔවුන් වහන්සේ ද රස බැලූ බවය. එපමණක් නොව, ඔවුන් වහන්සේ කුරුසිය මතදී මාගේ සියලු දුක වේදනාව සහ කරදර සියල්ලම දරාගත් බවය. මා හඬන විට, මට දැනෙන තනිකම සහ මාගේ අනාගතය පිළිබඳව මා සිතන දේ ඔවුන් වන්සේ තේරුම් ගන්නේය.

මගේ හදවත දුකින් නිදහස් වන්නේ කවදාදැ යි මට දැන් හැගේ? දෙවියන් වහන්සේ මැවූ මාර්ගය තුළ  කරදර මධ්‍යයේ (සියලු චිත්තවේගයන් සමග) ගමන් කිරීමට

කාලයත් සමග සිදු වන අතර සියලු අභිමිවීම් වල අත්දැකීම විඳ ගැනීමෙන් පසුව යථා තත්ත්වයට පත්වීමට අපගේ ආත්මයට  හැකි වේ. බොහෝ පීඩා වලට මුහුණ දුන් දාවිත් ඔහුගේ අත්දැකීම පිළිබඳව සාක්ෂිය ගීතාවලියේ 23:3 පදයේ මෙසේ සඳහන් කර ඇත. "එතුමාණෝ .... මා පණගන්වන සේක. ..... " මෙම දිනවලදී මා ගීතාවලිය 23 වෙනි ගීතිකාව සහ තවත් ගීතිකා දෙකක් සමග දිනකට කිහිප වතාවක් යාච්ඤා කරන අතර, ඔවුන් වහන්සේගේ වචනය කෙරෙහි විශ්වාසය තැබූ මටත් අන් සියලුම දෙනාටත් ඔවුන් වහන්සේ දුන් පොරොන්දු ඉටු කරනා බවට බවට මා මුළු සිතින්ම විශ්වාස කරමි.

අද දවස සහ මේ මොහොත ගැන පමණක් මම විශ්වාසය තබමි. එවිට මට සියල්ල කළමනාකරණය කර ගත හැකි වන අතර,  එසේ නොවුනහොත් මට කළකිරීමත් සමග සියල්ල එපා වී යන්නේය. ඔවුන් වහන්සේ සෑම දිනයකදීම මා සමග ගමන් කරනා බවටත් සියල්ලේදී අවශ්‍ය ශක්තිය මට ලබා දීමට ඔවුන් වහන්සේට හැකි බවටත් මා විශ්වාස කරමි. දිනපතා මා හට කිරීමට ඇති දේවල් දැන් වෙනදාට වඩා අඩු වන අතර, සමහර අවස්ථාවලදී සියල්ල නතර කර දමා විවේක ගැනීම සඳහා මම මාගේ මුණුපුරන් සමග කාලය ගත කරන්නෙමි.

දෙවියන් වහන්සේගේ වචනය කෙරෙහි මාගේ මුළු විශ්වාසය තබමින් ඒ තුළ ඇළී සිටීම මා ජීවිතයට විශාල උපාකාරයකි. දේව සේවයේ යෙදීමේදී අභියෝග සහ අරගල වලට මුහුණ දීමට සිදු වූ සෑම අවස්ථාවකදීම එය පුරුදු පුහුණු වීමට අපට සිදුවිය. මාගේ දයාබර සහෝදරියනි, ඔබගේ ජීවිතයේදී ද විශාල පරීක්ෂාවකට මුහුණ දීමට පෙර එය පුරුදු පුහුණු වන ලෙස මා ඔබව දිරිගන්වන්නෙමි. ජේසුස් වහන්සේගේ පොරොන්දුවක් සහිත "........... මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි; කිසි අයුරකින් නුඹ අත් නොහරිමි...... "(හෙබ්‍රෙව් 13:5) යන ශුද්ධ ලියවිලි පාඨය මා තරයේ විශ්වාස කරමි.  එය අනාගතයේදී මට කුමක් සිදුවේදැයි යන බිය මාගෙන් දුරු කරයි.

දෙවියන් වහන්සේ මා කෙරෙහි දක්වන ප්‍රේමය සහ කරුණාව පිළිබඳව මම ඔබට මෙසේ පවසන්නෙමි. මාගේ ස්වාමිපුරුෂයා සමිඳාණන් වහන්සේ වෙත ගිය දින සිට මේ දක්වා, මාගේ ස්වර්ගික පියාණන් ඔවුන් වහන්සේගේ සාමයෙන් මාගේ හදවත පුරවා ඇත. මම කඳුළු වැගිරුවද ඔවුන් වහන්සේගේ සාමය මට රාත්‍රියේ හොඳින් නිදා ගැනීමට ඉඩ සලසයි, එබැවින් මාගේ හදවතේ කිසි බියක් නැත.  දෙවියන් වහන්සේ මා කෙරෙහි දක්වන සැලකිල්ල සහ දයාව පිළිබඳව මම ඉතා හොඳින් දනිමි.

මාගේ ස්වාමිපුරුෂයා, ඔවුන් වහන්සේගේ කැඳවීමට විශ්වාස වන්තව සිටීම පිළිබඳවත්, දෙවියන් වහන්සේව නොහඳුන අය වෙත ළං වීම සඳහා ඔහු තුළ තිබූ දර්ශනය සහ මෙලොව වාසය කරන අවසාන මොහොත දක්වාම සමිඳාණන් වහන්සේට සේවය

කිරීම පිළිබඳවත් මම දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වන්නෙමි. දැන් අපට ඔහුව දැක ගැනීමට හැකි වන්නේ නම්, එතුමාගේ වැඩ කළ මුළු වසර ගණනාව, නිමක් නැති ගමන්, සියලු අරගල සහ පරීක්ෂාවන් අපගේ ගැළවුම් කරුවාණන් මුහුණට මුහුණ හමු වූ විට ඉතා වටිනා බව අපට කියන බව මම විශ්වාස කරමි.

මෙට්‍රොපොලිටන් හිමිපාණන් බොහෝ අවස්ථාවලදී හෙබ්‍රෙව් 12:1 හි සඳහන් වන ආකාරයේ විශාල සාක්ෂිකාර සේනාවක් අප වටා සිටීම පිළිබඳව කතා කළේය. එතුමාණන් ද මෙම සේනාව සමග එක්ව ඇති බව මම සිතන්නෙමි. අපි එතුමාණන්ගේ ආදර්ශය අනුගමනය කරමින් අපට ඉතිරි කළ දර්ශනය සහ මග පෙන්වීම සභාවක් ලෙස ඉදිරියට ගෙන යන ආකාරය දෙස එතුමාණන් උනන්දුවෙන් බලා සිටිනු ඇත..

දයාබර සොයුරියනි, අපි සදාකාලික ජීවිතය තෝරා ගනිමින්, මින් පෙර කිසිදා ශුභාරංචිය අසා නොමැති අය වෙත ශුභාරංචිය ගෙන යාම සඳහා අපගේ ජීවිත ආයෝජනය කරන්නේ නම්, එතුළින් අප අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේටත් සහ අපගේ ආධ්‍යාත්මික පියාණන්ටත් උපරිම ගෞරවය සහ ප්‍රීතිය ගෙන දෙන්නෙමු. එමෙන්ම අපගේ තියෝපිලස් මෙට්‍රොපොලිටන් හිමිපාණන් සහ සියලුම බිෂොප්වරුන් සහ නායකයින්ට අපගේ සභාව ඉදිරියට ගෙන යාම සඳහා දෙවියන් වහන්සේගේ ප්‍රඥාව සහ මග පෙන්වීම ලබා දෙන ලෙස විශ්වාසයෙන් යුතුව යාච්ඤා කරමු. සහෝදරියන් ලෙස, අප අපගේ සභාවට ආශිර්වාදයක් සහ දිරිගැන්වීමක් විය යුතුය.

අපි බලාපොරොත්තුවෙන් යුතුව ජීවත් වෙමු.

මාගේ දයාබර සොයුරියනි, පසුගිය මාස දෙකක කාලය තුළින් මා ගමන් කළ ආකාරය පිළිබඳව මෙම ලිපිය මගින් ඔබ සමග බෙදා ගත්තෙමි. නැවත නැගිටීමේ පොරොන්දුව තුළ මතු දිනකදී අපගේ වැළපීම ප්‍රීතියක් බවට පත්කරනු ඇත. අප අපගේ මෙට්‍රොපොලිටන් හිමිපාණන් සහ අපට පෙර උකුත්ව ගිය සියලුම දෙනා සමග නැවත එකට සිටින්නෙමු. එම අවස්ථාවේදී අප අපගේ ගැළවුම්කරුවාණන් සමග සදහටම වාසය කරනු ඇත.

ජේසුස් වහන්සේ තුළ මා ඔබට ප්‍රේම කරන බවත් ඔබ උදෙසා යාච්ඤා කරන බවත් මා ඔබට ප්‍රකාශ කරමි.

ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ සහෝදරිය,
ගිසිලා යොහානන්.